**පරන්තන් කෙමිකල් සමාගම - 2021**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

පරන්තන් කෙමිකල් සමාගමේ ("සමාගම") 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන

තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගම අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.5.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වසා දමා ඇති ආයතන 5කින් අයවිය යුතු රු.4,579,926ක් වූ ණය ශේෂ සහ ක්‍රියාත්මක තත්ත්වයේ පවතින ආයතනවලින් අයවිය යුතු වසර 05කට වඩා පැරණි වෙළඳ ණයගැති හා වෙනත් ණයගැති පිළිවෙලින් රු.1,413,382ක් හා 2,350,686ක් වූ ශේෂයන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වසා දමා ඇති ආයතන 2ක් සමාගම් පනතේ 487(3) වගන්තිය යටතේ කපා හැර ඇති බැව් සමාගම් රෙජිස්ටාර් දෙපාර්තමේන්තුව විසින් දැනුම් දී ඇත. ඒ අනුව මෙම ශේෂයන් පොත් වලින් ඉවත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල කමිටු අනුමැතිය ලැබී ඇත. තවද අනෙකුත් ආයතන වලට නීතිමය පියවර ගැනීමට ඇත.<br>ක්‍රියාත්මක ආයතන වලින් ලැබීමට නියමිත මුදල් සම්බන්ධයෙන් ඒම ආයතන දැනුවත් කර ඇතත් ප්‍රතිචාරයක් මෙතෙක් ලැබී නොමැත. | අවශ්‍ය අනුමැතීන් ලබාගෙන ගිණුම්වල ගැලපීම් කිරීමට හෝ ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.138,180,995ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.82,029,740 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.56,151,255 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ක්ලෝරීන් අලෙවි ආදායම රු.88,877,072 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සම්පූර්ණයෙන් ක්ෂය වී ඇති දැනටමත් භාවිතයේ පවතින පිරිවැය රු.255,843,931 ක් වූ දේපල පිරියත හා උපකරණ වල ප්‍රයෝජනවත් ජීවිත කාලය සමාලෝචනය කිරීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි. | සම්පූර්ණයෙන් ක්ෂය වී ඇති රු.34,935,915 ක් වන රථ වාහන ප්‍රත්‍යාගණනය කිරීම සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් කමිටුවක් 2022 නොවැම්බර් 25 දිනැති ලිපියෙන් පත් කර ඇත. ඒ අනුව අදාල කටයුතු සම්බන්ධීකරණය කරමින් පවතී. | ප්‍රත්‍යාගණනයක් සිදුකර ඒ අනුව ගිණුම් වලට අවශ්‍ය ගැලපීම් කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වගවත්ත නැවත පිරවුම්හලේ නිෂ්පාදනය කරනු ලබන බ්ලීච්, කළුතර නාගොඩ කර්මාන්තපුරයේ පිහිටි පරන්තන් කෙමිකල්ස් අංගනය වෙත ප්‍රවාහනය කර එහි දී කුඩා බෝතල් වලට අසුරා විකුණනු ලබයි. සමාලෝචිත වර්ෂයේ දී ක්ලෝරින් සියයට 5 ක් අඩංගු බ්ලීච් දියර ලීටර 38,725ක් සහ ක්ලෝරින් සියයට 10 ක් අඩංගු බ්ලීච් දියර ලීටර 65,905 ක් සපයා තිබුණද නාගොඩ අංගනයේ දී විකුණනු ලබන බ්ලීච් දියර බෝතල් පිළිබඳව තොග වාර්තා කිරීම හැර වගවත්ත අංගනයෙන් ලැබෙන හා ඉතිරි තොග පිළිබඳ කිසිදු සටහනක් නොතිබුණි. | බ්ලීච් තොග නිෂ්පාදනය වගවත්ත ඒකකයේ සිදු වන අතර නැවත පිරවීම සඳහා අවශ්‍ය ප්‍රමාණය නාගොඩ කර්මාන්තපුරය වෙත භාර දෙනු ලැබේ. තොග සඳහා භාණ්ඩ ලැබීම් වාර්තාව (GRR) වගවත්තේ දී නිර්මාණය කරන බැවින් නාගොඩට ලැබීමෙන් පසු නැවත භාණ්ඩ ලැබීම් වාර්තාවන් නිර්මාණය නොකරනු ඇත. අභ්‍යන්තර සන්නිවේදන ලේඛනයක් වන මාර්ග බිල්පත් යටතේ බෙදා හැරීම සිදු කෙරෙයි. | තොග පිළිබඳ සියලු සටහන් තැබීමට කටයුතු කළ යුතුය. |

## 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කළුතර නාගොඩ ෆුලර්ටන් කර්මාන්තපුරයේ පරන්තන් කෙමිකල්ස් ආයතනයට අයත් අක්කර දෙකකින් යුත් ඉඩමේ ඉදිකර ඇති වර්ග අඩි 5250කින් යුත් දෙමහල් කාර්යාල ගොඩනැගිල්ලේ උඩුමහල ඉහල කළමනාකාරීත්වයට සරිලන කාමර 02ක්, රසායනාගාරයක් සහ සම්මන්ත්‍රණ ශාලාවකින් සමන්විත වන අතර දැනට කිසිඳු භාවිතයකින් තොරව හිස් දියර බෝතල් අසුරා තබන ගබඩාවක් ලෙස භාවිතා කරනු ලබයි. එම හේතුවෙන් මෙම කාර්යාල ගොඩනැගිල්ල ඌන උපයෝජිතව භාවිතාවන බව දක්නට ලැබුණි. | මෙහි ආයතනයේ කාර්ය මණ්ඩලයේ නිලධාරින් සිව් දෙනෙක් සේවයේ නිරතව හිඳියි.<br>එසේම කෝස්ටික් දියර නිෂ්පාදන ව්‍යාපෘතිය සහ බ්ලීච් දියර බෝතල් කර ඇසිරීමේ කාර්යය මෙම පරිශ්‍රය තුල සිදු කරනු ලබයි.<br>කෝස්ටික් සෝඩා මෙට්‍රික් ටොන් 77.375 ක ප්‍රමාණයක් මෙම ඒකකයේ දැනටමත් ගබඩා කර ඇති අතර ඉදිරි මාසයක කාලය තුල ලැබීමට නියමිත හයිඩ්‍රොක්ලෝරික් අම්ලය මෙට්‍රික් ටොන් 69ක් ද මෙම ස්ථානයේ ගබඩා කර බෙදා හැරීමට අවශ්‍ය කටයුතු සූදානම් කර ඇත. මෙම සියලු කාර්යයන් සම්බන්ධීරකරණ කටයුතු එම කාර්යාල පරිශ්‍රයේ සිට සිදු කරනු ලබයි. | මෙහි උඩුමහල කාර්යාල ගොඩනැගිල්ලක් වන බැවින් ගබඩාවක් ලෙස භාවිතා නොකළ යුතුය. |

## 3.4 ව්‍යාපෘති හෝ ප්‍රග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මෙරටට අවශ්‍ය කෝස්ටික් සෝඩා හා ක්ලෝරීන් මුළුමනින්ම ආනයනය මඟින් සපුරාගෙන තිබුණි. පරන්තන්හි පිහිටා ඇති අක්කර 227 ක භූමියේ ක්ලෝරීන් නිෂ්පාදන කටයුතු සඳහා යන්ත්‍රාගාරයක් ස්ථාපිත කිරීමට 2016 වර්ෂයේ යෝජනා කර තිබූ අතර 2021 වර්ෂය දක්වා ශක්‍යතා අධ්‍යයනය වෙනුවෙන් රු.6,469,444ක්ද පරන්තන් ඉඩම සංවර්ධනය හා ශාක වගාව වෙනුවෙන් රු.4,693,617ක්ද ලෙස වියදම් දරා තිබුණද යන්ත්‍රාගාරය ඉදිකිරීම් කටයුතු මේ දක්වා ආරම්භ කර නොතිබුණි. | මෙම ව්‍යාපෘතියට අදාල ශක්‍යතා අධ්‍යයනය සිදු කිරීමේ කටයුතු සී/ස EML Consultants පුද්ගලික සමාගම විසින් අවසන් කර ඇති අතර, එහි ඇති පාරසරික බලපෑම (Environment Impact Assessment) පිළිබඳ අධ්‍යයනය එම ආයතනය විසින් සිදු කරමින් පවතී. ඒ අනුව ඉහත අධ්‍යයනය 2023 ජනවාරි 15 දිනෙන් නිම කිරීමට නියමිත අතර ඊට සමගාමීව ඉදිරි පියවරයන් ලෙස මහා භාණ්ඩාගාරය සමග සම්බන්ධීකරණය වෙමින් මූල්‍ය පහසුකම් ලබා ගැනීමට අවශ්‍ය පියවරයන් ගනිමින් පවතී. | පරන්තන් කම්හලෙහි ක්ලෝරීන් නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පරන්තන් කෙමිකල්ස් සමාගමේ අනුමත ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 10 ක නිලධාරීන් 05 දෙනෙකු පමණක් සේවයේ යෙදෙන අතර, එම පුරප්පාඩු තුළ ඇතුලත් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුර 2019 වර්ෂයේ සිට හා සහකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය) තනතුර 2013 වර්ෂයේ සිට 2022 ඔක්තෝබර් 30 දින දක්වා අදාල තනතුරු පිරවීමට සමාගම කටයුතු කර නොතිබුණි. | පරන්තන් කෙමිකල්ස් සමාගමේ අනුමත කාර්යය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ අනුමත තනතුරු සහ අනෙකුත් තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට අවස්ථා ගණනාවකදී කර්මාන්ත අමාත්‍යාංශයට සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට ඉල්ලීම් ඉදිරිපත් කර ඇති නමුත් ඒ සඳහා මෙතෙක් අනුමැතියක් ලැබී නොමැත | පුරප්පාඩු කඩිනමින් පිරවීමට කටයුතු කළ යුතුය. |

# 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අයවැයගත හා තත්‍ය ආදායම පරීක්ෂාවේදී අයවැයගත ආදායමට වඩා කොස්ටික් සෝඩා, බ්ලීච් ද්‍රාවණය, හයිඩ්‍රොක්ලෝරික් ඇසිඩ් අලෙවිය අඩුවීම හේතුවෙන් රු.65,983,000ක ආදායමක් සමාගමට අහිමි වී ගොස් තිබුණි. | 2021 වසර පුරාවට ආයතනය සතුව හයිඩ්‍රොක්ලෝරික් අම්ල තොග නොතිබීම හා 2021 වසර තුලත් රට තුල පැවති කොරෝනා වෛරස පාලන හේතුන් මත රට වසාතැබීම ආදී කරුණු කෝස්ටික් සෝඩා පතුරු, බ්ලීච් දියර අලෙවියටත් බලපාන ලදී. එසේම බ්ලීච් දියර සඳහා ලක්විජය බලාගාරය වෙත තිබූ පැරණි ටෙන්ඩරයේ සැපයුම අවසන් වීම සහ නව ටෙන්ඩරය අහිමි වීමත් යන කරුණුද අපේක්ෂිත ආදායම අහිමි වීමට හේතු විය. | අයවැය තුල ආදායම පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය. |